# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )
## පළමු සෙමෙස්තරය -2018/2019
## SLG 3158 - සිංහල නාට්‍ය සම්ප්‍රදාය
(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

01. සිංහල නාට්‍ය කලාවේ පසුබිම ගැන සමාලෝචනයක යෙදෙමින් කලාත්මක අංග ලක්ෂණවලින් සමන්විත සිංහල නාට්‍ය කලාවක් මෙරට ගොඩ නැගුණ අන්දම පැහැදිලි කරන්න.

02. **ශෛලිගත නාට්‍ය සම්ප්‍රදාය** සහ **තාත්වික නාට්‍ය කලාව** සතු ප්‍රධාන ලක්ෂණ පෙන්වා දෙමින්, නූතන සිංහල නාට්‍ය ඉතිහාසය තුළ මේ නාට්‍ය දෙවර්ගය සිදු කළ බලපෑම් විග්‍රහ කරන්න.

**නැතහොත්**

එදිරිවීර සරච්චන්ද්‍රගේ **පේමතො ජායතී සෝකො** නාට්‍යය සහ සුගතපාල ද සිල්වාගේ **දුන්න දුනු ගමුවේ** නාට්‍යය නාට්‍යය රසිකයාගේ අවධානයට බඳුන් වුණු අන්දම විස්තර කරන්න.

03. දයානන්ද ගුණවර්ධන සිංහල නාට්‍ය කලාවේ අභිවෘද්ධියට දායක වූ අන්දම පෙන්වා දෙමින් **ගජමන් පුවත** නාට්‍යය නූතන සිංහල නාට්‍ය නිර්මාණ අතරෙහි හිමි කර ගන්නා අනන්‍යතාව පෙන්වා දෙන්න.

04. "හෙන්රි ජයසේන, ස්වතන්ත්‍ර නාට්‍ය රචනයේ දී හා නිෂ්පාදනයේ දී ද ප්‍රබල අනන්‍යතාවක් විශද කළ නාට්‍ය කරුවෙකි" මේ අදහස ඔහුගේ **කුවේණි** නාට්‍යය ඇසුරින් සාකච්ඡා කරන්න.

05. "සයිමන් නවගත්තේගමගේ **සුභ සහ යස** නාට්‍යය ජනප්‍රවාදයක් ආශ්‍රයෙන් නිර්මාණය කළ ද, එය නූතන ප්‍රේක්ෂකයාගේ කල්පනය පුබුදු කරන්නාවූ කලාත්මක අගයෙන් අනූන දේශපාලන නාට්‍යයකි." විමසන්න.

06. මතු දැක්වෙන නාට්‍යකරුවන් අතුරින් **දෙදෙනෙකු** තෝරාගෙන ඒ දෙදෙනා සිංහල නාට්‍ය කලාව අධ්‍යයනයේ දී වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

1. සුගතපාල ද සිල්වා
2. සෝමලතා සුභසිංහ
3. ජයලත් මනෝරත්න

*********************